# 9 දේව ප්‍රසාද නිධාන

දේව ප්‍රසාද නිධානයක් යනු උත්ථාන ව වැඩ සිටින දෙවි සමිඳුන් හමුවීම සඳහා ඇතුළතින් අප වෙත දානය කරනු ලබන දේව වරප්‍රසාද පිටස්තර වශ යෙන් සලකුණු කෙරෙන අයුරින් ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති සංඥා පිළිවෙත් වේ.

මේ අනුව, දේව ප්‍රසාද නිධානයක ප්‍රධාන ලක්ෂණ හතරක් ඇතුළත් වේ. එම ලක්ෂණ 4 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නමැති දේව ප්‍රසාද නිධානය ඇසුරෙන් මෙසේ පැහැදිලි කළ හැකි ය.

1. ඇතුළතින් ලබා දෙන දේව වරප්‍රසාද ලබා දීම - ජේසුස් වහන්සේ
2. බාහිර ලෙස එය සලකුණු කිරීම - පූප හා මිදි යුෂ ඇසුරෙන්
3. ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර තිබීම - මහ බ්‍රහස්පතින්ද අන්තිම රාත්‍රි භෝජනයේ දී
4. සංඥා පිළිවෙත් (වත්පිළිවෙත්) අඩංගු වීම - දිව්‍ය පූජාව



9.1 රූපය - කරඬුවක තැන්පත් කර ඇති දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් අප ජේසුස් වහන්සේ ව ලබා ගනිමු. ඔවුන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය ලබා ගැනීම තුළින් අපගේ දේව ජීවිතය පෝෂණය වන බව විශ්වාස කරමු. මෙය ඇතුළතින් ලැබෙන දේව වරප්‍රසාදය යි. එමෙන් ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මහ බ්‍රහස්පතින්ද අන්තිම රාත්‍රී භෝජනයේ දී ස්ථාපිත කරන ලද්දේ, ක්‍රිස්තුන් වහන්සේ විසින් ය. ඔවුන් වහන්සේ භාවිත කළ පූප හා

මිදි යුෂ දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතෙහි බාහිර සලකුණු වන අතර, එය පිළිවෙතක් ලෙස සැමරීම දිව්‍ය පූජාව තුළින් සිදු වේ.

දේව ප්‍රසාද නිධාන හතක් තිබේ. පහත පින්තූරයෙන් එම දේව ප්‍රසාද නිධාන හත පෙන්නුම් කරයි.



9.2 රූපය - උත්ථාන වූ දෙවි සමිඳුන් හමුවන දේව ප්‍රසාද නිධාන හත

ස්වභාවික හා ආධ්‍යාත්මික ජීවිතයේ අවධි අතර සමානකම් තිබේ.

- ★ උපත - ප්‍රසාද ස්නාපනය
- ★ පෝෂණය වීම - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
- ★ වැඩිවියට පත්වීම - අභිවෘද්ධි ආලේපය
- ★ ජීවිත තත්ත්වයන් තෝරා ගැනීම - ආශිර්වාදකාර බන්ධනය/ පූජකවරය
- ★ රෝග වැළදීම හෝ දුර්වල වීම - සමගි සන්ධානය හා රෝගීන් ආලේපය

එම නිසා ජීවිත අවස්ථාවන් පදනම් කර ගෙන ආධ්‍යාත්මික ජීවිතය ද ඊට සමාන්තර ව වැඩෙන පිණිස දේව ප්‍රසාද නිධාන ද ලබා ගත යුතු ව ඇත. දේව ප්‍රසාද නිධාන තුළින් ක්‍රිස්තුන් වහන්සේ දේව වරප්‍රසාද ලබා දෙන සේක. එසේ ම නිදහස් කැමැත්තෙන් හා අවබෝධයෙන් ඒවා ලබා ගත යුතු වේ. තව ද බෞතීස්මය ලබා කතෝලිකයකු වූ සැම කෙනෙක් ම අනෙකුත් දේව ප්‍රසාද නිධාන නියමිත වයසේ දී හෝ අදළ අවස්ථාවේ දී ලබා ගත යුතු ය. දේව ප්‍රසාද නිධාන පහත සඳහන් අයුරින් වර්ග කළ හැකි ය.




එක් වරක් පමණක් ලබා ගත හැකි ප්‍රසාද නිධාන තුනක් තිබේ. ඒවා නම්;

1. ප්‍රසාද ස්නාපනය
2. අභිවෘද්ධි ආලේපය
3. පූජකවරය

①



9.3 රූපය - ප්‍රසාද ස්නාපනය

②



9.4 රූපය - අභිවෘද්ධි ආලේපය

③



9.5 රූපය - පූජකවරය

මෙම දේව ප්‍රසාද නිධාන එක් වරක් පමණක් ලබා ගන්නේ ඒවායින් ආත්මය තුළ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් වන නිසා ය. එක් එක් දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද පහත වගුවේ දැක්වේ.

| දේව ප්‍රසාද නිධානය | ලැබෙන වරප්‍රසාද |
|---|---|
| ප්‍රසාද ස්නාපනය | දේව දරුකම, පව් සමාව හා ශුද්ධාත්මයාණන් තුළ නව ජීවිතය |
| පාපොච්චාරණය | පව් සමාව |
| දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ | ජේසුස් වහන්සේ ව ම අපට ලැබේ |

| | |
|---|---|
| අභිවෘද්ධි ආලේපය | පරිණත කිතුනුවන් ලෙස සාක්ෂි දැරීමට අවශ්‍ය වරප්‍රසාද |
| ආශිර්වාදකාර බන්ධනය | විවාහ දිවියේ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය දේව වරප්‍රසාද<br>විවාහ ගිවිසුම තුළ දෙදෙනාගේ යහපත හා දරුවන් ජනනය හා ඔවුන් පුහුණු කිරීම |
| පූජකවරය | ක්‍රිස්තුන් වහන්සේ විසින් අපෝස්තුලුවරුන්ට පැවරූ දූත සේවාව අඛණ්ඩ ව පවත්වා ගෙන යාමට අවශ්‍ය දේව වරප්‍රසාද |
| රෝගීන්ගේ ආලේපය | ආත්මික සුවය හා සමහර අවස්ථාවල දී ශාරීරික සුවය |

### ක්‍රියාකාරකම

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. දේව ප්‍රසාද නිධාන යනු කුමක් ද?
2. මේ දක්වා ඔබ ලබා ඇති දේව ප්‍රසාද නිධාන මොනවා ද?
3. ආරම්භක දේව ප්‍රසාද නිධාන ලබා ගත යුතු කාල වකවානු වගුවක දක්වන්න.
4. i ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නොලැබූ මිතුරකුට හෝ
   ii ඉරුදින දිව්‍ය පූජාව අතපසු කරන මිතුරකුට හෝ
   iii සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය නොලබන මිතුරකුට ඔබ දෙන උපදෙස් **දෙකක්** ලියන්න.



***ජීවිතයට බිඳක්***

***නියමිත වයසේ දී නියමිත දේව ප්‍රසාද නිධාන ලබා ගන්න.***